23980



සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv. Level) Examination, 2025

දේශපාලන විද්‍යාව II
அரசியல் விஞ்ஞானம் II
Political Science II

23 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත්, පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස්:**

* මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **තුනකින්** සමන්විත ය.
* I කොටසින් අවම වශයෙන් **එක්** ප්‍රශ්නයක් ද, II කොටසින් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** ද, III කොටසින් අවම වශයෙන් **එක්** ප්‍රශ්නයක් ද වන සේ තෝරාගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

1. දේශපාලන විද්‍යාවේ පහත සඳහන් ඕනෑම උප ක්ෂේත්‍ර **දෙකක්** පිළිබඳව කෙටියෙන් සාකච්ඡා කරන්න.
   (i) දේශපාලන ආයතන done
   (ii) දේශපාලන න්‍යාය
   (iii) දේශපාලන මතවාද done
   (iv) තුලනාත්මක දේශපාලනය (ලකුණු 10 × 2 = 20)

2. "රාජ්‍යය යනු නිශ්චිත භෞමික දේශසීමා තුළ ස්වාධිපති බලය ක්‍රියාත්මක කරන උසස්ම දේශපාලන ආයතනයයි." සාකච්ඡා කරන්න. (ලකුණු 20)

3. පහත සඳහන් ඕනෑම ආණ්ඩුක්‍රම **දෙකක** ප්‍රධාන ලක්ෂණ සාකච්ඡා කරන්න.
   (i) ජනාධිපති ආණ්ඩුක්‍රමය
   (ii) පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය
   (iii) අර්ධ ජනාධිපති (මිශ්‍ර) ආණ්ඩුක්‍රමය (ලකුණු 10 × 2 = 20)

## II කොටස

4. කෝල්බෲක්-කැමරන් ප්‍රතිසංස්කරණවලට අදාළව පහත සඳහන් ඕනෑම **දෙකක්** සාකච්ඡා කරන්න.
   (i) ආණ්ඩුකාරවරයාගේ බලතල අඩු කිරීම done
   (ii) ස්වාධීන අධිකරණයකට පදනම දැමීම
   (iii) පරිපාලන ක්‍රමය මධ්‍යගත කිරීම done (ලකුණු 10 × 2 = 20)

[දෙවැනි පිටුව බලන්න

5. (i) ඩොනමෝර් ව්‍යවස්ථාව මගින් විධායක කාරක සභා ක්‍රමය හඳුන්වා දුන්නේ ඇයි? (ලකුණු 05)

(ii) එහි ක්‍රියාකාරිත්වයට එරෙහිව ඉදිරිපත් වූ විවේචන මොනවා ද? (ලකුණු 15)

6. 1947/48 සෝල්බරි ව්‍යවස්ථාව යටතේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ බලතල හා කාර්යයන් 1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව යටතේ ජාතික රාජ්‍ය සභාවේ බලතල හා කාර්යයන් සමග සසඳන්න. (ලකුණු 20)

7. (i) ශ්‍රී ලංකාවේ වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ශ්‍රේෂ්ඨාධිකරණයේ ඕනෑම ප්‍රධාන අධිකරණ බල ක්ෂේත්‍ර **පහක්** දක්වන්න. (ලකුණු 05)

(ii) 'ශ්‍රී ලංකාවේ වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අධිකරණයේ ස්වාධීනත්වය ප්‍රමාණවත් ලෙසින් සහතික කරයි.' විවේචනාත්මකව අගයන්න. (ලකුණු 15)

## III කොටස

8. පහත සඳහන් ඕනෑම මාතෘකා **දෙකක්** කෙටියෙන් සාකච්ඡා කරන්න.

(i) අමෙරිකා එක්සත් ජනපද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රධාන ලක්ෂණ

(ii) එක්සත් රාජධානියේ ඒකීය ආණ්ඩුක්‍රමයේ වෙනස් වන ස්වභාවය

(iii) ස්විස් කැන්ටන්වල ස්වයං පාලන බලතල (ලකුණු $10 \times 2 = 20$)

9. ලෝකයෙහි නව දේශපාලන හා ආර්ථික ප්‍රවණතා ශ්‍රී ලංකාවට ඇතිකරන බලපෑම් සාකච්ඡා කරන්න. (ලකුණු 20)

10. පහත සඳහන් ඕනෑම **දෙකක්** පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියේ දී දේශපාලන පක්ෂවල කාර්යභාරය

(ii) සාමය ගොඩනැඟීමේ සංකල්පය

(iii) ලෝක සාමය සහතික කිරීමේ දී එක්සත් ජාතීන්ගේ කාර්යභාරය

(iv) නිරාගමිකවාදය

(v) ශ්‍රී ලංකාවේ වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ විධායක ජනාධිපති ධුරයෙහි පවතින ප්‍රජාතන්ත්‍ර විරෝධී ලක්ෂණ

(ලකුණු $10 \times 2 = 20$)

* * *

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න